ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/25/04/23

**මාධ්‍ය නිවේදනය**

2022 වසරට අදාළව පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාග පිළිතුරු පත්‍ර ඇගයීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සහ මාධ්‍ය වාර්තා පදනම් කරගෙන ස්වයං මැදිහත්වීමෙන් මෙම ගැටළුව සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

එම පැමිණිල්ලට අනුව මෙම පිළිතුරු පත්‍ර ඇගයීම සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සම්බන්ධ නොවීම මත මෙම ප්‍රමාදය සිදුව ඇත. ඒ අනුව මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අද දින (2023.04.25) විභාග කොමසාරිස් ජනරාල් අමිත් ජයසුන්දර මහතා සහ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ සභාපති මහාචාර්ය ඩී.එම්.එච්.එස්.කේ. බන්නැහැක මහතා ද සහභාගී විය. එහිදී අදහස් දැක්වූ විභාග කොමසාරිස්වරයා පෙන්වා දුන්නේ මෙම විභාගයේ ප්‍රශ්ණ පත්‍ර සකස්කිරීමේ කටයුතු වල සිට පිළිතුරු පත්‍ර ඇගයීම අවසාන වනතෙක් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වය ඊට ලබාගැනීම පදනම් කරගෙන මෙම විභාගයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පවත්වාගෙන යන බවයි. ඊට විශ්ව විද්‍යාල ආචාර්යවරුන් පුද්ගල මට්ටමෙන් දායක වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම කරුණ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනයේ සභාපති මහාචාර්ය ඩී.එම්.එච්.එස්.කේ. බන්නැහැක මහතා ද පිළිගන්නා ලද අතර, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ද ඉලක්ක වී ඇති අධික බදු පිළිබඳ ගැටළුවට විසඳුමක් නොලැබීම මත මෙලෙස විභාග ඇගයීම් කටයුතු වලින් ඉවත්වීමට තීරණය කර ඇති බවයි. තවද මෙම තීරණයේ මුඛය අරමුණ අනාගත ශ්‍රී ලංකාවේ ප්‍රමිතිගත සහ ගුණාත්මක විභාග පවත්වාගෙන යාමටත්, විශ්ව විද්‍යාල තුළ ද ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීමේ අවකාශය ශ්‍රී ලාංකීය දරුවන්ට ලබාදීමේ අරමුණින් සිදුකරන්නක් මිස ආචාර්යවරුන්ගේ අද දවසේ පෞද්ගලික උවමනාවක් මත ගත් තීරණයක් නොවන බවයි.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනී විනිසුරු රෝහිණී මාරසිංහ මැතිණිය ප්‍රකාශ කරන ලද්දේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ කමිටුවක් පත්කර සාකච්ඡා කළ යුතු බවයි. ශ්‍රී ලංකාවේ විභාගවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය සම්බන්ධයෙන් පවතින ජාත්‍යන්තර පිළිගැනීමට හානියක් නොවන ලෙස විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සේවය මෙම විභාග කටයුතු වලට ලබාගැනීමට අදාල පාර්ශවයන් කටයුතු කළ යුතු බවත් ය. තවද විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය වෙතින් සභාපතිනිය ඉල්ලා සිටිනුයේ පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතු වලින් මෙම අවස්ථාවේ ඉවත් නොවී තම ඉල්ලීම් දිනා ගැනීමේ ක්‍රියාමාර්ගය උසස් පෙළ පිළිතුරු ඇගයීම් අවසන් වන තෙක් කල්දමන ලෙසත් ය.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.04.25